සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 ශ්‍රේණිය

## විද්‍යාව

**නම / විභාග අංකය :-**..................................................................  **කාලය: පැය 02 යි**

1 පත්‍රය

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පෘථිවියේ පවතින පරිභෝජනයට ගත හැකි ජල ප්‍රතිශතය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 0.1%  (2) 0.01%  (3) 0.001%  (4) 70%

02. ශාක ආහාර නිපදවීමේ දී වායුගෝලයෙන් ලබා ගන්නා වායුව කුමක් ද?

(1) ඔක්සිජන්  (2) නයිට්‍රජන්  (3) හයිඩ්‍රජන්  (4) කාබන්ඩයොක්සයිඩ්

03. ශාක තුළ පමණක් සිදුවන ජීව ක්‍රියාවලිය වන්නේ,

(1) චලනය  (2) ප්‍රජනනය  (3) වර්ධනය  (4) ප්‍රභාසංස්ලේෂණය

04. පිළිවෙලින් තත්, පටල, වායු කඳක් කම්පනය වන උපකරණ අඩංගු නිවැරදි පිළිතුරු වන්නේ,

(1) වයලීනය, තම්මැට්ටම, සර්පිනාව  (2) ගිටාරය, බෙරය, උඩැක්කිය

(3) වීනාව, නළාව, උඩැක්කිය  (4) වයලීනය, රබාන, තම්මැට්ටම

05. දීප්ත වස්තු පමණක් අඩංගු පිළිතුරු තෝරන්න.

(1) සූර්යයා, කණාමැදිරියා  (2) සූර්යයා, ඵබදුල්ලාගේ එළිය

(3) චන්ද්‍රයා, ආලෝකය විහිදුවන හතු  (4) ග්‍රහලෝක, ඵබදුල්ලා

06. මුහුදු ජලයේ වැඩිපුරම අඩංගු ලවණය කුමක් ද?

(1) කැල්සියම් කාබනේට්  (2) සෝඩියම් කාබනේට්

(3) සෝඩියම් ක්ලෝරයිඩ්  (4) කැල්සියම් ක්ලෝරයිඩ්

07. ස්කන්ධයක් රහිත, අවකාශයේ ඉඩක් අත්කර නොගන්නා ද්‍රව්‍ය,

(1) ඝන ද්‍රව්‍ය වේ.  (2) ශක්ති වේ.  (3) වායු වේ.  (4) පාදාර්ථ වේ.

08. දඬු ආකාර P, Q, R ද්‍රව්‍ය තුනක එක් අග්‍රයක් චුම්බකයක N හා S ධ්‍රැව අසලව ළංකල විට නිරීක්ෂණය කළ දේ පහත වගුවේ දැක්වේ.

| ද්‍රව්‍ය | N අග්‍රය වෙතට | S අග්‍රය වෙතට |
|---|---|---|
| P | ආකර්ෂණය වේ. | විකර්ෂණය වේ. |
| Q | ආකර්ෂණය වේ. | ආකර්ෂණය වේ. |
| R | ආකර්ෂණය හෝ විකර්ෂණ නොවේ. | ආකර්ෂණය හෝ විකර්ෂණ නොවේ. |

P, Q, R විය හැක්කේ පිළිවෙලින්,

(1) චුම්බකය, යකඩ ඇණය, කාබන් කූර  (2) චුම්බකය, කාබන් කූර, යකඩ ඇණය

(3) යකඩ ඇණය, කාබන් කූර, චුම්බකය  (4) කාබන් කූර, යකඩ ඇණය, චුම්බකය

09. ෆොසිල ඉන්ධන සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) පොළොව අභ්‍යන්තරයෙන් ලබා ගනී.  (2) ජෛව ස්කන්ධ දහනය වීමෙන් හටගනී.

(3) ඒවායේ සූර්යයාගේ ශක්තිය අන්තර්ගත වී ඇත  (4) දිනෙන් දින ක්ෂය වෙමින් පවතී.



LIVEWORKSHEETS

10. භාවිතයෙන් ඉවත් කළ CFL බල්බ පරිසරයට එකතු වීම අහිතර කර වීමට වඩාත්ම බලපාන හේතුව වන්නේ,




(1) එහි වීදුරු අන්තර්ගත වීමයි.

(2) ඒවායේ අහිතකර වායු අන්තර්ගත වීමයි.

(3) ඒවායේ රසදිය අන්තර්ගත වීමයි.

(4) එහි පීනෝල හා නැප්තලීන් වැනි සංයෝග අන්තර්ගත වීමයි.

11. ආලෝකය මත වෙනස් වන ප්‍රතිරෝධකයක් ඇති උපකරණයක සම්මත සංකේතය මින් කුමක් ද?

(1)  (2)  (3)  (4) 

12. විදුලි අනතුරු වැලකීම සඳහා ගෘහ විද්‍යුත් පරිපථයක අනිවාර්යයෙන්ම තිබිය යුතු උපාංගය වන්නේ,

(1) ප්‍රධාන ස්විචය (2) විදුලි මීටරය (3) පැන්නුම් ස්විචය (4) භූගත කම්බිය

13. ද්‍රව → ඝන අවස්ථා විපර්යාසය සඳහා උදාහරණයක් වන්නේ,

(1) තුෂාර ඇතිවීම (2) යකඩ ද්‍රව වීම (3) අයිස්කැට දියවීම (4) අයිස්කැට සෑදීම


14. ආහාර දාම සම්බන්ධව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සෑම ආහාර දාමයක්ම ශාක භක්ෂකයකුගෙන් ආරම්භ වේ.

(2) ආහාර දාමයක් පුරුක් තුනකින් යුක්ත වේ.

(3) පරිසරයේ සමතුලිත බව සඳහා සෑම පුරුකක්ම ආධාර වේ.

(4) ආහාර දාමයක දෙවන පුරුක මාංශ භක්ෂකයකු වේ.



15. රූපයේ දැක්වෙන උපකරණය හා එහි කාර්යය දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) සුළං දිශා දර්ශකය - සුළගේ දිශාව මැනීම. (2) අනිල මානය - සුළගේ වේගය මැනීම.

(3) ආර්ද්‍රතා මානය - ආර්ද්‍රතාවය මැනීම (4) වර්ෂා මානය - වර්ෂාපතනය මැනීම.

16. විදුලි පරිපථයක් තුළින් විදුලි ධාරාවක් එක් දිශාවකට පමණක් ගමන් කිරීමට සලසන උපාංගය වන්නේ,

(1) ඩයෝඩය (2) ධාරිත්‍රකය (3) ස්විචය (4) ආලෝක සංවේදී ප්‍රතිරෝධක

17. භංගුර, ආඝාත්‍ය සහ තන්‍ය යන ලක්ෂණ සහිත ද්‍රව්‍ය පිළිවෙලින් අඩංගු පිළිතුර තෝරන්න.

(1) වීදුරු, යකඩ, රබර් (2) වීදුරු, රත්රන්, ප්ලාස්ටික්

(3) අඟුරු, රබර්, තඹ (4) අඟුරු, තඹ, ඇලුමිනියම්

18. එන්ජිමක් මගින් ඩයිනමෝවක් කරකවා විදුලිය ලබාගන්නා විදුලි බලාගාරය වන්නේ,

(1) කැළණිතිස්ස (2) රන්ටැඹේ (3) නොරොච්චෝලය (4) වික්ටෝරියා

19. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ශාකවල වර්ධනය යම් කාලයකට පසු නවතී.

(2) හරිතප්‍රද වර්ණකය නැති වුවත් සතුන් ආහාර නිෂ්පාදනය කරයි.

(3) සතුන්ගේ වර්ධනය ජීවිත කාලය පුරාම සිදු වේ.

(4) දෙබෙදුම් සුචි වල දී යම් ලක්ෂණයක් ඇති නැති බව අනුව වර්ග කරයි.

20. නාය යෑම් හා සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) ලංකාවේ වැඩිපුර සිදුවන්නේ නුවරඑළිය, රත්නපුර ප්‍රදේශවලයි.

(2) ඉහළින් පිහිටි පස්, ගල්, ගස් වැලි පහළ ප්‍රදේශයකට ලිස්සා යාමක් මෙහි දී සිදු වේ.

(3) නායයෑම් සඳහා පෘථිවියේ ගුරුත්ව බලය හේතු නොවේ.

(4) කඳු බෑවුම් නාය යෑම් වලට මිනිසාගේ අයපත් ක්‍රියාවන් වැඩිපුර හේතු වේ.



LIVEWORKSHEETS